**රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත භාර අරමුදල - 2015**

රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත භාර අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු, 2005 අගෝස්තු 03 දින අත්සන් කරන ලද අංක 109 දරන භාර ඔප්පුවේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. අංක 109 දරන භාර ඔප්පුවේ 22 වගන්තිය ප්‍රකාර 2015 වර්ෂය සඳහා ඉදිරිපත් කළ යුතු මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටද ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් පිළිබඳව වන මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

අංක 109 දරන භාර ඔප්පුවේ 22 වගන්තිය ප්‍රකාර 2015 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2018 ඔක්තෝබර් 12 දින දක්වාම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් සහ වගකීම්වල පැවැත්ම**

ආයතනය විසින් අවසානයට ඉදිරිපත් කරන ලද 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර පහත සඳහන් කෙරේ.

| **වත්කම්** | **2014** |
|---|---|
| | රු. |
| ජංගම ගිණුම | 127,907 |
| විකුණනු ලබන බවට වන ගිවිසුමක් යටතේ මිලදී ගන්නා ලද සුරැකුම්පත් | 54,238,218 |
| භාණ්ඩාගාර බැදුම්කර | 875,497,049 |
| ලැබිය යුතු පොළී | 285,994 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | 484,776,813 |
| | **1,414,925,981** |

| | |
|---|---|
| වගකීම් | |
| ---------- | |
| අනෙකුත් ගෙවිය යුතු | 251,135 |
| භාර ප්‍රාග්ධනය | 1,366,971,976 |
| රඳවාගත් ලාභය (ගෙවිය යුතු ලාභාංශ) | 47,702,870 |
| | **1,414,925,981** |

**2.3 විගණනය සහා ලිඛිත සාක්ෂි නොමැති වීම**

අරමුදල විසින් සමාලෝචිත වර්ෂය සඳහා පවත්වාගෙන යනු ලබන තොරතුරු තුළ ඇතුළත් පහත සඳහන් අයිතමයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| **අයිතමය** | **වටිනාකම** | **ඉදිරිපත් නොකළ සාක්ෂි** |
|---|---|---|
| | **රු.** | |
| භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු | 484,776,813 | භාණ්ඩාගාරයෙන් ලබාගන්නා ලද ශේෂ සනාත කිරීම. |
| හවුල්කරුවන් 12 දෙනෙකුගේ ගිණුම් | 1,313,328,898 | හවුල්කරුවන්ගෙන් ලබාගන්නා ලද ශේෂ සනාත කිරීම. |

**2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | **නීති, රීති, රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 2005 අගෝස්තු 03 දින අත්සන් කරන ලද අංක 109 දරන භාර ඔප්පුවේ (ඒ) ඡේදයෙහි 12 වගන්තිය. | භාරකාර මණ්ඩලය අවම වශයෙන් මාස 03 කට වරක්වත් රැස්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් පවත්වා නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත භාර අරමුදල සහ භාර කළමනාකරු වශයෙන් ලංකා බැංකුව අතර එළැඹි 2005 අගෝස්තු 03 දිනැති අවබෝධතා ගිවිසුමේ විෂය අංක 06. | අරමුදලට දායකවන එක් එක් සහභාගීකත්ව රාජ්‍ය ආයතනවලින් මාස 06 කට වරක්වත් ඔවුන්ගේ පුරෝකථනය කළ අරමුදල් ප්‍රවාහ විස්තර භාර කළමනාකරුට ඉදිරිපත් කරන ලෙස භාරකරුවන් ඉල්ලා සිටිය යුතුයි. එසේ වුවත්, මෙවැනි පුරෝකථනය කරන ලද අරමුදලේ ප්‍රවාහ විස්තර සමාලෝචිත වර්ෂය තුළදී භාර කළමනාකරුට ලැබී නොතිබුණි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**
-----------------------------

**3.1** **කාර්යසාධනය**
-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පූර්ව වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අරමුදලේ සමස්ත ආයෝජනය රු.4,829,382 කින් අඩුවී තිබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේ මුළු පොළී ආදායම රු.12,668,938 කින් අඩු වී තිබුණි.

(ආ) අරමුදලේ එක් හවුල්කරුවෙක් තම මුළු තැන්පතු ප්‍රමාණය වූ රු.88,280,470 ක් සමාලෝචිත වර්ෂයේදී ඉවත් කරගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

**4.** **පද්ධති හා පාලනයන්**
-------------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
| --- | --- |
| ලෙජර ගිණුම් | භාර අරමුදල විසින් නිසි පරිදි ලෙජර ගිණුම් පවත්වා නොතිබුණි. |
| ආයෝජකයින් පිළිබඳ ලිපිලේඛන | අදාළ සියලුම ලිපිලේඛන ඇතුළත්වන පරිදි එක් එක් ආයෝජකයින් සඳහා වෙන වෙනම ලිපි ගොනු පවත්වා ගෙන ගොස් නොතිබුණි. |